# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1175 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 16/07/2024 පැය 2230

**පොලිස් පරීක්ෂක නිලධාරීන්ගේ දැනුම, වෘත්තීයභාවය සහ ආකල්ප වර්ධනය කිරීමේ වැඩමුළුවේ සමාප්තිය.**

ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ සංවිධානය සහ මෙහෙයවීම යටතේ, පොලිස් දෙපාර්තමේන්තුවට අනුයුක්ත පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන්හට ඔවුන්ගේ දැනුම වෘත්තීයභාවය සහ ආකල්ප වර්ධනය කිරීම වෙනුවෙන් ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලයේ (ඕස්ට්‍රේලියානු ෆෙඩරල් පොලිසිය) මූල්‍ය අනුග්‍රහය යටතේ මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන් සහ ස්ථානාධිපතිවරුන් වෙනුවෙන් වැඩමුළුවක් 2024.07.15 හා 2024.07.16 යන දෙදින තුළ කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේදී පැවැත්විණි.

මෙම වැඩමුළුවේ සමාරම්භක උත්සවය සඳහා ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මහතා, අතිගරු ඕස්ට්‍රේලියානු මහකොමසාරිස් පෝල් ස්ටීවන්ස් මහතා, ගරු මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වියානි ගුණතිලක මහතා සහ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා සහභාගී විය.

2024.07.16 වන අද දින පස්වරුවේ පවත්වන ලද මෙම වැඩසටහනේ සමාප්ති උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ඔස්ට්‍රේලියානු ෆෙඩරල් පොලීසියේ ශ්‍රී ලංකාව හා මාලදිවයින කලාපය භාර ජ්‍යෙෂ්ඨ නිලධාරී මැතිව් ඉනස් (Detective Superintendent Matthew Innes) මහතා සහභාගී විය. තවද සම්බන්ධීකරණ නිලධාරී ලූක් ෆොල්ඩන් (Luke Folden) මහතා ඇතුළු ඔස්ට්‍රේලියානු ෆෙඩරල් පොලීසියේ උසස් නිලධාරීන් පිරිසක්ද මෙම අවස්ථාවට සහභාගී වූ අතර වැඩමුළුවට සහභාගී වූ මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන් හා ස්ථානාධිපතිවරුන් 80 දෙනෙකුට මෙම වැඩමුළුව සාර්ථකව අවසන් කිරීම වෙනුවෙන් සහතිකපත්‍ර ප්‍රදානය කරන ලදී.

මෙහිදී පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය මඟින් ඔස්ට්‍රේලියානු ෆෙඩරල් පොලීසියේ නිලධාරී මණ්ඩලය වෙත වැඩමුළුව සඳහා ලබාදුන් දායකත්වය වෙනුවෙන් සමරු තිළිණ ප්‍රදානය කිරීමක් සිදුකරන ලදී.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්




ශ්‍රී ලංකා
Police
D.S. Fonseka
AFP
CERTIFICATE OF COMPLETION
POLICE





ශ්‍රී ලංකා
Sri Lanka
Police Inspectors'
Association
AFP


ශ්‍රී ලංකා
AFP
CERTIFICATE OF COMPLETION








**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**